**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:29/2024**

මගේ අංකය:NP/07/10/01/179
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2024.10.29

ප්‍රධාන ලේකම්
ආණ්ඩුකාරවර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
උතුරු පළාත

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2024**

ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A15/PPSC/MSO.Ltd/2024 දරණ 2024.07.31 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරව ද, යාපනය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් / සහකාර තේරීම්භාර නිලධාරීගේ අංක EL/J/PE/2024/27 දරණ 2024.10.20 දිනැති ලිපියෙන් ලද එකඟතාවය අනුව ද, උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2024 දෙසැම්බර් මස** පවත්වනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024.11.25** වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2013.04.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති අනුකූලව තෝරාගන්නා අයදුම්කරුවන් පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

02.2. මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

02.3. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4. එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 03 ක් අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.6. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය. මෙම තනතුර සඳහා 2024.01.22 දින වන විට පුරප්පාඩු වලින් 30% (පුරප්පාඩු 55 ක්) සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලැබේ.

## 03. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර MN-2-2016 අනුව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය රු.28,940 -10 X 300/= - 11 X 350/= - 10 X 560/= - 10 X660/= රු.47,990/= ක් වේ. (රු.29,840/= වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය).

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුතු විය යුතු අතර ම, මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

04.3. අයදුම්කරු, මෙම **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර මෙහි සඳහන් සියලුම සුදුසුකම්** සපුරා තිබිය යුතුය.

04.4. සීමිත තරඟ විභාගයක් මගින් බඳවා ගන්නා විට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

05.1. **අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට **නොවැඩි** වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) ඇතුළුව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ /ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ්‍යය අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

05.2. **අනෙක් සුදුසුකම්**

(අ) **උතුරු පළාත් රාජ්‍ය සේවයේ** ස්ථිර තනතුරක් දරණ, එම තනතුරුවල සේවය ස්ථිර කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව ප්‍රාථමික මට්ටමේ (Primary Level) PL වැටුප් කාණ්ඩයට අයත් තනතුරක හෝ MN 1 - 2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධාරියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් උතුරු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

<u>සටහන</u>

යම් කිසි තනතුරකට ස්ථිරව පත් කිරීමට ප්‍රථම සේවය කර ඇති හෝ යම් කිසි තනතුරකට අදාළව ස්ථිර වශයෙන් පත් කිරීමේ කොන්දේසිය යටතේ සේවය කර ඇති හෝ පුහුණුවක් ලැබීමේ කාල සීමාවක් ඉහත **05.2 (ආ)** හි සඳහන් සුදුසුකම් ලැබීමට අවුරුදු පහක කාලසීමාවක් ලෙස ගණනය කරනු නොලැබේ. කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලබාදීමට පෙර තාවකාලික/අනියම් සේවා පදනම මත සේවය කර ඇති කාල සීමාව ද ඉහත සඳහන් **05.2 (ආ)** හි සඳහන් කර ඇති සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය අවුරුදු පහක කාලසීමාවක් ලෙස ගණනය කරනු නොලැබේ.

<u>සැළකිය යුතුයි</u>

**සියලුම අයදුම්කරුවන් තනතුරට අදාළ සියලුම සුදුසුකම් 2024.11.25 වන දිනට හෝ ඊට ප්‍රථම සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.**

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත පරීක්ෂණයකින් හා කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති , ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. නමුත් ඒ සඳහා ලකුණු ලබාදෙන්නේ නැත. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

06.2. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන්ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3. පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි III වන ශ්‍රේණියේ තනතුර සඳහා පවතින පුරප්පාඩු වලින් 30% ක් (පුරප්පාඩු 55 ක්) සීමිත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. කෙසේ වෙතත් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතු අතර, ප්‍රශ්න පත්‍ර දෙක සඳහාම ලබාගත යුතු මුළු ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් 50% ක් ලබාගත යුතුය.

06.4. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට තුනක් (3%) ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කරනු ලැබේ. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතු අතර, ප්‍රශ්න පත්‍ර දෙක සඳහාම ලබාගත යුතු මුළු ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් 50% ක් ලබාගත යුතුය. පත්වීමක් සඳහා තෝරා ගන්නා අයදුම්කරුවෙකු තම ආබාධිත තත්ත්වය අදාළ තනතුරේ සේවය කිරීමට කිසිදු බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය වාර්තාවක් මගින් සනාථ කළ යුතුයි.

<u>සටහන</u>

අයදුම්කරු ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන පුනරුත්ථාපන තත්ත්වය යටතේ නියමිත පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, ආබාධිත පුද්ගලයෙකු නොවන අයදුම්කරුවෙකු තමා ආබාධිත පුද්ගලයෙකු බවට සඳහන් නොකළ යුතුයි.

## 07. විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත සම්පූර්ණ කර 2024.11.25 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනැවිත් හෝ භාරදිය යුතුය.

08.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2024"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. විභාගය ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

08.4. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - 021-2219939, ෆැක්ස් අංකය - 021-2219940)

<u>**සටහන**</u>

ඉල්ලීම් ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, ඉල්ලුම්පත්‍රයේ පිටපතක්, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ දිනය, සහතික කරන ලද විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, විභාගය ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය.

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකි පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමක් හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට්)
(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසිවලට පටහැනිව ක්‍රියා කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වන අතර, මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01 | අභියෝගයතා පරීක්ෂණය | පැය 01 යි | 100 යි |
| 02 | කළමනාකරණ සේවා නිලධාරි සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය | පැය 02 ½ යි | 100 යි |

**01. අභියෝගයතාව**

මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ සංඛ්‍යාමය හැකියාව, තර්කානුකූල හැකියාව, සාමාන්‍ය බුද්ධිය යන කරුණු පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

**02. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය**

මෙම ප්‍රශ්න පත්‍රය, අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනා, ඉදිරිපත් කරන දත්තවලට අනුකූලව ලිපි කෙටුම්පත් කිරීම, ඉදිරිපත් කරන ඡේද කෙටි කර ලිවීම, වාක්‍යවල අන්තර්ගතය තනි වාක්‍යකින් ලිවීම, ඉදිරිපත් කර ඇති දත්ත උපයෝගී කරගෙන ප්‍රස්ථාර හා වගු සකස් කිරීම, සරල ව්‍යාකරණ ක්‍රම භාවිතය, කාර්යාලයීය ලියකියවිලි පිළිබඳව කටයුතු කරන ආකාරය හා නිලධරයෙකු පියවර ගත යුතු විෂයයන් අඩංගු ලිපියක් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ රෙගුලාසීන් හා මූලික නියෝග යන කරුණු කළමනාකරණ සේවා නිලධාරියෙකුගේ රාජකාරීන් සම්බන්ධයෙන් අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කිරීම, ඇමතුම් දිනපොත, වවුචර, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රා, රබර් මුද්‍රා, තැපැල් මල්ල හා එය භාවිතයේ දී කාර්යාලය විසින් උපයෝගී කරගන්නා ක්‍රම ගැන අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

**12. විභාග ප්‍රතිඵල**

අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් උතුරු පළාත් සභා නිළ වෙබ් අඩවියේ (www.np.gov.lk) පළ කරනු ලැබේ.

**13.** විභාගය පැවැත්වීම සඳහා නියමිත නගර හා එම නගර සඳහා වූ අංක පහත සඳහන් වේ.

| <u>නගරය</u> | <u>නගර අංකය</u> |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |

එක් නගරයක් වෙනුවෙන් ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ඊට ආසන්න නගරයට මාරු කරනු ඇත.

**14.** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"** සතුවේ. දෙමළ හා සිංහල මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

**<u>සැළකිය යුතුයි</u>**

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iii. මෙම චක්‍රලේඛය ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය යටතේ සේවය කරනු ලබන සුදුසු නිලධාරීන්ගේ අවධානයට යොමුකිරීම පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කරගත යුතුය.

**එස්.තිරුවාකරන්**
ලේකම්
උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2024.10.29